# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2010 ඔක්තෝබර් මස 01 වන දින

## II වන කොටස

## අතිරේකය

(2010.10.04 දින නිකුත් කරන ලදී)


## පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන)

**මහ නගර සභා ආඥාපනත, නගර සභා ආඥාපනත සහ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යතුමාගේ නියමය පරිදි පළ කරන ලදී.


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

මිළ : රු. 8.00 යි. තැපැල් ගාස්තුව : රු. 5.00 යි.

# පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන)

එල්. ඩී.—ඕ. 19/2008.

**මහ නගර සභා ආඥාපනත, නගර සභා ආඥාපනත සහ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2010 අංක      දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

## I වන කොටස

**(252 වන අධිකාරය වූ) මහ නගර සභා ආඥාපනතට කරනු ලබන සංශෝධන**

252 වන අධිකාරයේ 5 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**2.** (මෙහි මින් මතු “ප්‍රධාන ප්‍රඥප්තිය” යනුවෙන් සඳහන් කරනු ලබන) (252 වන අධිකාරය වූ) මහ නගර සභා ආඥාපනතේ 5 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:—

“මහ නගර සභාවේ සංයුතිය

5. (1) සෑම එක් එක් මහ නගර සභාවක් ම:—

(අ) (262 වන අධිකාරය වූ) පළාත් පාලන ඡන්ද විමසීම් ආඥාපනතේ (3ඇ) වගන්තිය යටතේ ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන තෝරා ගත් සභිකයන් සංඛ්‍යාවකින්; සහ

(ආ) (262 වන අධිකාරය වූ) පළාත් පාලන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ වගන්තිය යටතේ සභිකයන් වශයෙන් තෝරා යැවිය යුතු ඡන්ද විමසීමක දී මහ නගර සභාව තුළ නියෝජනයක් නොලැබූ ඡන්දදායකයින්ට නියෝජනයක් ලබා දීම සඳහා සභිකයන් වශයෙන් තෝරා පත්කර යැවිය යුතු, එම

ආඥාපනතේ (3ඇ) වගන්තිය යටතේ ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන තෝරා ගත් සභිකයින්ගෙන් සියයට තිහක් නොඉක්මවනු ලබන සභිකයන් සංඛ්‍යාවකින්,

සමන්විත විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් සියයට තිහක් සංයුක්ත වන සංඛ්‍යාව පූර්ණ සංඛ්‍යාවක් සහ භාග සංඛ්‍යාවක් වන අවස්ථාවක දී, එම උපවගන්තියේ කාර්යය සඳහා එකී සියයට තිහ සංයුක්ත වන සංඛ්‍යාව ලෙස, පූර්ණ සංඛ්‍යාව සලකනු ලැබිය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කිරීම.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය, එම වගන්තියේ (3) වන උපවගන්තියේ සඳහන් “පළාත් පාලන ආයතන මැතිවරණ ආඥාපනතේ විධිවිධානවලට අනුකූලව” යන වචනවල සිට එම උපවගන්තියේ අවසානය දක්වා ඇති වචන වෙනුවට “(262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන මැතිවරණ ආඥාපනතේ 66අ වගන්තියේ විධිවිධානවලට අනුකූලව පිරවිය යුතු අතර, එසේ තෝරා පත් කරගනු ලැබූ තැනැත්තා සභාවට සභිකයන් තෝරා පත් කර ගැනීම සඳහා වන ඊළඟ මහා මැතිවරණය තෙක් සභිකයකු වශයෙන් ධුරය දැරිය යුතු ය.” යන වචන ආදේශ කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය සංශෝධනය කිරීම.

**4.** ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 24 දරන පනතින් සංශෝධිත 14 වන වගන්තිය පහත දැක්වෙන පරිදි තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එම වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදය ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:—

“(ආ) තම ධුරයෙන් ඉල්ලා අස්වෙන හෝ තම ධුරය හිස් කරනු ලබන නගරාධිපතිවරයා හෝ නියෝජ්‍ය

නගරාධිපතිවරයා කෙසේ වුව ද, සභිකයකු ලෙස දිගටම කටයුතු කළ යුතු ය.”; සහ

(2) එම වගන්තියේ (7) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

“(7) මහ නගර සභාවක නගරාධිපතිවරයාගේ ධුරය පුරප්පාඩු වූ ඕනෑම අවස්ථාවක දී, එම පුරප්පාඩුව පිළිබඳව කොමසාරිස්වරයා විසින් වහාම පළාත් පාලන කොමසාරිස්වරයා වෙත දැන්විය යුතු අතර, එවිට, එම පුරප්පාඩුව පිරවීම සඳහා පළාත් පාලන කොමසාරිස්වරයා විසින්, ඒ සම්බන්ධයෙන් පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ විධිවිධාන සලස්වා ඇති ආකාරයට කටයුතු කළ යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 215අ වගන්තිය සංශෝධනය කිරීම.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 215අ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) “අයවැය ලේඛනය හෝ පරිපූරක අයවැය ලේඛනය” යන වචනවල සිට එම අවසානය දක්වා වූ වචන ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :—

“අයවැය ලේඛනය නැවතත් සභාවට ඉදිරිපත් කරනු ලැබ එය එසේ නැවත ඉදිරිපත් කිරීමෙන් සති දෙකක් ඇතුළත සම්මත කරනු නොලැබූ අවස්ථාවක එකී සති දෙකක කාලයක් අවසන් වීමෙන් පසුව නගරාධිපතිවරයා ස්වකීය නගරාධිපති ධුරයෙන් ඉල්ලා අස් වූ ලෙස සලකනු ලැබිය යුතු ය.”;

(2) එම වගන්තියේ පැති සටහන වෙනුවට පහත දැක්වෙන පැති සටහන ආදේශ කිරීමෙන්:—

“සභාව විසින් අයවැය ලේඛනය සම්මත නොවීමේ ප්‍රතිඵලය.”.

II වන කොටස

**(255 වන අධිකාරය වූ) නගර සභා ආඥාපනතට කරනු ලබන සංශෝධන**

**6.** (මෙහි මින් මතු “ප්‍රධාන ප්‍රඥප්තිය” යනුවෙන් සඳහන් කරනු ලබන) (255 වන අධිකාරය වූ) නගර සභා ආඥාපනතේ 5 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

255 වන අධිකාරයේ 5 වන වගන්තිය ප්‍රතියෝජනය. කිරීම.

“නගර සභාවේ සංයුතිය

5. (1) සෑම එක් එක් නගර සභාවක්ම:—

(අ) (262 වන අධිකාරය වූ) පළාත් පාලන ඡන්ද විමසීම් ආඥාපනතේ (3ඇ) වගන්තිය යටතේ ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන තෝරා ගත් සභිකයන් සංඛ්‍යාවකින් ; සහ

(ආ) (262 වන අධිකාරය වූ) පළාත් පාලන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ වගන්තිය යටතේ සභිකයන් තෝරා යැවිය යුතු ඡන්ද විමසීමක දී මහ නගර සභාව තුළ නියෝජනයක් නොලැබූ ඡන්ද දායකයන්ට නියෝජනයක් ලබා දීම සඳහා සභිකයන් වශයෙන් තෝරා පත් කර යැවිය යුතු එම ආඥාපනතේ (3ඇ) වගන්තිය යටතේ ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන තෝරා ගත් සභිකයන්ගෙන් සියයට තිහක් නොඉක්මවනු ලබන සභිකයන් සංඛ්‍යාවකින්,

සමන්විත විය යුතු ය.’’;

(2) (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් සියයට තිහක් සංයුක්ත වන සංඛ්‍යාව පූර්ණ සංඛ්‍යාවක් සහ භාග සංඛ්‍යාවක් වන අවස්ථාවක දී, එම උපවගන්තියේ කාර්යය සඳහා එකී සියයට තිහ සංයුක්ත වන සංඛ්‍යාව ලෙස, පූර්ණ සංඛ්‍යාව සලකනු ලැබිය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය සංශෝධනය කිරීම.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය, එම වගන්තියේ (3) වන උපවගන්තියේ “ඒ සම්බන්ධයෙන් තත්කාලයේ අදාළවන යම් ලිඛිත නීතියක විධිවිධාන” යන වචන වෙනුවට “(262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන මැතිවරණ ආඥාපනතේ 66අ වගන්තියේ විධිවිධාන” යන වචන ආදේශ කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය සංශෝධනය කිරීම.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ “තත්කාලයේ අදාළ වන යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනුකූලව” යන වචන වෙනුවට “(262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන මැතිවරණ ආඥාපනතේ විධිවිධානවලට අනුකූලව” යන වචන ආදේශ කිරීමෙන් ;

(2) එම වගන්තියේ (2) වන උපවගන්තියේ “ධුරය දැරිය යුතු ය. සභාපතිවරයකු හෝ උප සභාපතිවරයකු ස්වකීය ධුරය හිස් කළ කවර අවස්ථාවක වුව ද, ඔහු සභිකයකුව සිටීම ද ඒ සමගම අවසන් වන්නේ ය.” යන වචන වෙනුවට “ධුරය දැරිය යුතු ය. සභාපතිවරයා හෝ උප සභාපතිවරයා ධුරයෙන් ඉල්ලා අස්වුව ද, සභාවේ සභිකයකු ලෙස ධුර දැරිය යුතු ය.”. යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(3) එම වගන්තියේ (7) වන උපවගන්තිය ඉවත් කිරීමෙන් හා ඒ වෙනුවට මෙහි පහත සඳහන් උපවගන්තිය ආදේශ කිරීමෙන් ;

“(7) නගර සභාවක සභාපතිවරයාගේ ධුරය හිස් වූ කවර අවස්ථාවක වුව ද, එම පුරප්පාඩුව පිළිබඳ නිවේදනය සභාවේ ලේකම්වරයා විසින් වහාම පළාත් පාලන කොමසාරිස්වරයා වෙත දැනුම් දිය යුතු අතර, එම පුරප්පාඩුව පිරවීම සම්බන්ධයෙන් (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ විධිවිධානවලින් සලසා ඇති ආකාරයට, එම පුරප්පාඩුව පිරවීම සඳහා පළාත් පාලන කොමසාරිස්වරයා ක්‍රියා කළ යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 178අ වන වගන්තිය සංශෝධනය කිරීම.

**9.** ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 24 දරන පනත මගින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 178 අ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :—

(1) "අයවැය ලේඛනය හෝ පරිපූරක අයවැය ලේඛනය" යන වචනවල සිට එම වගන්තියේ අවසානය දක්වා වූ සියලු වචන ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :—

"අයවැය ලේඛනයක් නැවත සභාවට ඉදිරිපත් කරනු ලැබ එය එසේ නැවත ඉදිරිපත් කරනු ලැබීමෙන් සති දෙකක් ඇතුළත සම්මත කරනු නොලැබූ අවස්ථාවක, එකී සති දෙකක කාලය අවසන් වීමේ දී සභාවේ සභාපතිවරයා සභාපති ධුරයෙන් ඉල්ලා අස් වූ ලෙස සලකනු ලැබිය යුතු ය."; සහ

(2) එම වගන්තියේ පැති සටහන වෙනුවට පහත දැක්වෙන පැති සටහන ආදේශ කිරීමෙන් :—

"නගර සභා විසින් අයවැය ලේඛනය සම්මත නොවීමේ ප්‍රතිඵලය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 184 වන වගන්තිය සංශෝධනය කිරීම.

**10.** ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 24 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 184 වන වගන්තිය, එම වගන්තියේ (3) වන උපවගන්තියේ "තත්කාර්යයට අදාළව තත්කාලයෙහි බලපවත්නා වෙනත් යම් ලිඛිත නීතියකින්" යන වචන වෙනුවට "සහ (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ විධිවිධාන" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 249 වන වගන්තිය සංශෝධනය කිරීම.

**11.** ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 24 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 249 වන වගන්තියේ "සභාපතිවරයා සහ උප සභාපතිවරයා" යන යෙදුමේ අර්ථ නිරූපනයේ "තත්කාර්යයට අදාළව තත්කාලයෙහි බලපවත්නා ලිඛිත නීතියේ විධිවිධානවලට" යන වචන වෙනුවට "පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ විධිවිධාන" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

III වන කොටස

**1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතට කරනු ලබන සංශෝධන**

1987 අංක 15 දරන පනතේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.

**12.** (මේ කොටසේ මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 4 වන වගන්තිය ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:—

"ප්‍රාදේශීය සභාවේ සංයුතිය.

4(1). 2 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ වූ නියමයක් මගින් පිහිටුවනු ලද සෑම ප්‍රාදේශීය සභාවක්ම:—

(අ) (262 වන අධිකාරය වූ පළාත් පාලන ඡන්ද විමසීම් ආඥාපනතේ (3ඇ) වගන්තිය යටතේ ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන සභිකයන් සංඛ්‍යාවකින්; සහ

(ආ) (262 වන අධිකාරය වූ) පළාත් පාලන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ වගන්තිය යටතේ සභිකයන් තෝරා යැවිය යුතු ඡන්ද විමසීමක දී, සභාව තුළ නියෝජනය නොලැබූ ඡන්දදායකයින්ට නියෝජනයක් ලබා දීම සඳහා සභිකයින් වශයෙන් තෝරාපත් කර යැවිය යුතු, එම ආඥාපනතේ (3ඇ) වගන්තිය යටතේ ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන තෝරා ගත් සභිකයන්ගෙන් සියයට තිහක් නොඉක්මවන සභිකයන් සංඛ්‍යාවකින්;

සමන්විත විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් සියයට තිහ සංයුක්ත වන සංඛ්‍යාව පූර්ණ සංඛ්‍යාවක් සහ භාග සංඛ්‍යාවක් වන අවස්ථාවකදී, එම උපවගන්තියේ කාර්ය සඳහා එකී සියයට තිහ සංයුක්ත වන සංඛ්‍යාව, එකී පූර්ණ සංඛ්‍යාව ලෙස සළකනු ලැබිය යුතුය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 169 වන වගන්තිය සංශෝධනය කිරීම.

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ 169 වන වගන්තිය, පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) "යම් අයවැය ලේඛනයක් හෝ පරිපූරක අයවැය ලේඛනයක්" යන වචනවල සිට එම වගන්තිය අවසානය දක්වා වූ සියලු වචන ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන වචන ආදේශ කිරීමෙන්:—

> "යම් අයවැය ලේඛනයක් එසේ පසුව ඉදිරිපත් කරනු ලැබීමෙන් පසු දෙසතියක් ඇතුළත දී ප්‍රාදේශීය සභාව විසින් එය සම්මත නොකරනු ලැබූ අවස්ථාවක, එකී සති දෙකක කාලසීමාව අවසන් වීමෙන් පසු එකී ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ධුරයෙන් ඉල්ලා අස්වූ ලෙස සලකනු ලැබිය යුතු ය."; සහ

(2) එම වගන්තියේ පැති සටහන වෙනුවට පහත දැක්වෙන පැති සටහන ආදේශ කිරීමෙන් :—

> "ප්‍රාදේශීය සභාව විසින් අයවැය ලේඛනය සම්මත නොවීමේ ප්‍රතිඵලය.".

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**14.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.